මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ **54** **2023.07.05**

**මැතිවරණ කොමිෂන් සභාවේ නව සභාපති ඇතුළු සාමාජිකයන් රාජකාරි ආරම්භ කිරීම**

අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ. හා 103(1) ව්‍යවස්ථා අනුව මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් මහත්වරුන් පත්කොට ඇත.

- මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (විශේෂ ශ්‍රේණියේ) නිලධාරියකු වූ ආර්.එම්.ඒ.එල්.රත්නායක මහතා පත්කොට ඇත. ඒ මහතා 1986 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සම්පූර්ණ සේවා කාලය මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා මැතිවරණ කොමිෂන් සභාවේ සේවය කොට මැතිවරණ කොමසාරිස් ජනරාල් වශයෙන් විශ්‍රාම ගත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙකි.

- මැතිවරණ කොමිෂන් සභාවේ නව සාමාජිකයකු ලෙස පත් කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (විශේෂ ශ්‍රේණියේ) නිලධාරියකු වූ එම්.ඒ.පී.සී.පෙරේරා මහතා ද 1986 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සම්පූර්ණ සේවා කාලය මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා මැතිවරණ කොමිෂන් සභාවේ සේවය කොට මැතිවරණ කොමසාරිස් ජනරාල් වශයෙන් විශ්‍රාම ගත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙකි.

- මැතිවරණ කොමිෂන් සභාවේ නව සාමාජිකයකු වශයෙන් පත් කොට ඇති අමීර් මොහමඩ් ෆායිස් මහතා ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු වන අතර, සිවිල් සමාජ ක්‍රියාකාරීවරයෙකි.

මැතිවරණ කොමිෂන් සභාව සඳහා පත්කිරීමට නියමිත සාමාජිකයන් අතුරින් දැනට පත්කර ඇති ඉහත නම් සඳහන් සභාපති ඇතුළු සාමාජිකයන් 2023 ජූලි මස 05 වන දින රාජකාරි ආරම්භ කිරීම සිදුකළ බව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිවේදනය කරනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
**මැතිවරණ කොමසාරිස් ජනරාල්**